**මාර්ග සංවර්ධන අධිකාරිය - 2013**

**------------------------------------**

මාර්ග සංවර්ධන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1981 අංක 73 දරන මාර්ග සංවර්ධන අධිකාරිය පනතේ 16 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.182,855,614 ක් පිරිවැය වූ ගොඩනැගිලි ඉදිකරන ලද, ඉඩම්වල වටිනාකම අගය කර ගිණුම්ගත කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් සභාපති විසින් ඔහුගේ පිළිතුරෙහි, මෙසේ දක්වා තිබුණි. අධිකාරිය ස්ථාපිත කරන අවස්ථාවේදී මහා මාර්ග දෙපාර්තමේන්තුව විසින් මෙම රජයේ ඉඩම් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා තිබූ බවත්, එහෙත් ඉඩම්වල නෛතික හිමිකාරීත්වය මාර්ග සංවර්ධන අධිකාරියට පවරා නොමැති බවත්, ගිණුම්වල ඉඩම් වටිනාකම දක්වා නොමැති බවත්, එහෙත් මාර්ග සංවර්ධන අධිකාරියේ පරිශ්‍රමය මත 2014 ඔක්තෝබර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉඩම් මාර්ග සංවර්ධන අධිකාරියට නොමිලයේ ප්‍රදානයක් ලෙස වෙන් කිරීමට අනුමත කර ඇති බවත් දන්වා තිබුණි.

(ආ) ස්ථාවර වත්කම් අපහරණයෙන් ලද රු.31,295,832 ක මුදල් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙනත් ආදායම ලෙස දක්වා තිබුණද, අධිකාරිය විසින් අත්පත් කරගත් දින සිට එම වත්කම්වල පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේදී හිමිකම් ඔප්පු අංක 2176 යටතේ පවරා ගන්නා ලද හෙක්ටයාර් 0.6399 ක වපසරියකින් යුත් වදුලවත්ත ඉඩම මූල්‍ය ප්‍රකාශනවල රු.373,786 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මෙම ඉඩමේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.5,500,002 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) කොළඹ - කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතියට අයත් වූ රු.69,977,580 ක් වටිනා ස්ථාවර වත්කම් 2013 දෙසැම්බර් 31 වන විට මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කර තිබුණද එම වත්කම්වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) රු.68,945,445 ක් වටිනා විෂයයන් 214 කට අදාළ ස්ථාවර වත්කම් වටිනාකම හා මාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් පිළිබඳ විදේශ මූල්‍යායන ව්‍යාපෘති 2 ක් විසින් මිලදී ගෙන පසුව මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කරන ලද වටිනාකම ලබා ගත නොහැකි විෂයයන් 239 කට අදාළ ස්ථාවර වත්කම් අගය කර සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඊ) හෙක්ටයාර් 0.62018 ක් වූ දාබරේ මාවත පිහිටි මකුළුදෙණිය ඉඩම හිමිකම් ඔප්පු අංක 1413 යටතේ 1998 ජූලි 01 දින රු.මිලියන 45 ක වටිනාකමට මාර්ග සංවර්ධන අධිකාරියට මාරු කර තිබුණි. ඉන්පසු මෙම ඉඩම කැබලි 34 කට හා කැබලි 13 කට කොටස්කර මාසික ගෙවීම් පදනම මත පාර්ශවයන් 13 කට ලබා දී තිබුණි. කෙසේ වුවද ඉඩමේ වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(උ) මහ නැඟුම සමාගමෙන් ලැබිය යුතු ගිණුම් දෙකක ශේෂයන්ට අදාළ රු.8,077,693 ක මුදලක් මහ නැඟුම සමාගමේ රඳවාගත් වගකීම් ලෙස ඇතුළත් කර තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම්වල රු.3,180,163,323 ක මුළු රඳවාගත් මුදල් ඉහත ලැබිය යුතු ශේෂ හිලව් කිරීමෙන් පසු දක්වා තිබුණි.

(ඌ) රු.702,340,332 ක් වූ සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන අධිකාරියේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් කාර්යයන් යටතේ මුදල් නොවන ගැලපීමක් ලෙස ගලපා තිබුණි. කෙසේ වුවද මෙම මුදල අධිකාරියේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට අය කරන ලද රු.807,020,009 ක පාරිතෝෂික වියදම් සමඟ ගැලපී නොතිබුණි. මීට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින් කරන ලද තථ්‍ය පාරිතෝෂික ගෙවීමද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

(එ) වර්ෂයකට වැඩි කාලයක් ඉක්ම වූ දෝෂ වගකීම් කාලයට අදාළ ඉදිකිරීම් වැඩ සඳහා රඳවා ගැනීම් මුදල් පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් වල ඇතුළත් කළ යුතුය. කෙසේ වුවද මුළු රඳවා ගැනීම් මුදල් රු.5,457,277,045 ක් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ඒ) අධිකාරියේ සියලු කාර්ය මණ්ඩලයට අදාළ රු.1,742,994,462 ක් වූ මුළු විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. කෙසේ වුවද සියලු කාර්ය මණ්ඩලයේ මුළු විශ්‍රාම ප්‍රතිලාභ වර්ෂයක් ඇතුළත ගෙවිය යුතු නොවේ.

**2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය ශේෂ හා 2013 දෙසැම්බර් 31 දිනට අදාළ බැංකු විසින් සනාථ කරන ලද ශේෂ අතර රු.4,021,182,592 ක වෙනස්කම් නිරීක්ෂණය විය. තවද වෙනස්කම් සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

| **ණය ලබාදුන් ආයතන** | **මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය** | **බැංකු සනාථ කිරීම අනුව ශේෂය** | **වෙනස** |
|---|---:|---:|---:|
| | රු. | රු. | රු. |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 5,338,068,661 | 6,447,202,263 | 1,109,133,602 |
| ලංකා බැංකුව | 13,341,101,109 | 11,087,204,025 | 2,253,897,084 |
| ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | 932,970,602 | 274,818,696 | 658,151,906 |

(ආ) උප කාර්යාල 06 ක බැංකු සැසඳුම් ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සහ අදාළ බැංකු විසින් සනාථ කරන ලද ශේෂ අතර රු.515,350 ක ශේෂයක් නිරීක්ෂණය විය.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) වැඩ පූර්ව හා වෙනත් අත්තිකාරම්

(I) 2004 සිට 2007 වර්ෂය දක්වා කොන්ත්‍රාත්කරුවන් 51 දෙනෙකුට ලබා දෙන ලද රු.389,680,307 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් අයකර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(II) සැපයුම්කරුවන්ට ලබා දෙන ලද රු.74,632,936 ක් වූ මිලදී ගැණුම් අත්තිකාරම්වල ඇතුළත් වර්ෂ 5 කට වඩා පැරණි රු.7,695,731 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(III) කොන්ත්‍රාත්කරුවන් 09 දෙනෙකුට අදාළව එකතුව රු.38,347,714 ක් වූ බැර ශේෂයන්, ණය කොන්දේසි අත්තිකාරම් (On Account Advances) ලෙස දක්වා තිබූ අතර එම ශේෂ කොන්ත්‍රාත්කරුවන්ගෙන් වැඩිපුර අයකර තිබූ මුදල් බව නිරීක්ෂණය විය. එහෙත් මෙම මුදල නිරවුල් කිරීම සඳහා 2013 දෙසැම්බර් දක්වා කටයුතු කර නොතිබුණි.

(IV) අදාළ කාර්යය නිම වූ වහාම ලබාදුන් අත්තිකාරම් නිරවුල් කළ යුතු වුවද 2011 හා 2012 වර්ෂ තුළදී කොන්ත්‍රාත්කරුවන් 11 දෙනෙකුට ලබා දුන් රු.59,782,618 ක් වූ ණය කොන්දේසි අත්තිකාරම් (On Account Advances) 2013 දෙසැම්බර් 31 වන විටත් කොන්ත්‍රාත්කරුවන් විසින් නිරවුල් කර නොතිබුණි.

(V) මහ නැඟුම මාර්ග ඉදිකිරීම් සමාගමෙන් අයකරගත යුතු වර්ෂ 05 කට වඩා පැරණි රු.42,181,483 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගෙන නොතිබුණි.

(VI) කොන්ත්‍රාත්කරුවන් සඳහා ලබාදෙන අත්තිකාරම් කොන්ත්‍රාත්තුව නිම කිරීමට පෙර අයකරගත යුතු වුවද, 2011 හා 2012 වර්ෂ වලදී හා ඉකුත් වර්ෂ 05 තුළදී ලබාදුන් රු.24,309,117 ක් වූ අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 වන විටත් අයකර ගෙන නොතිබුණි.

#### (ආ) කුලී ආදායම හා ලැබිය යුතු කුලී

මාර්ග සංවර්ධන අධිකාරිය සතු බොරැල්ල උමං මාර්ගයේ වෙළඳ කුටි 4 කින් 2013 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 සිට 06 දක්වා කාලපරිච්ඡේදයක් ලැබිය යුතුව තිබූ කුලී ආදායම රු.1,877,835 ක් වූ අතර 2014 ජුනි 30 වන විටත් එම කුලී ආදායම වෙළඳුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මීට අමතරව අංක 04 දරන වෙළඳ කුටියෙන් ලැබිය යුතු රු.129,994 ක් වූ 2013 වර්ෂය සඳහා කුලිය ගෙවා නොතිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට මහනුවර උමං මාර්ගයේ වෙළඳ කුටි 17 කින් ලැබිය යුතු කුලිය රු.1,969,109 ක් විය. කෙසේ වුවද එම කුලී ආදායම අයකර ගැනීම සඳහා 2014 ජුනි 30 වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. "එම සාප්පු හිමිකරුවන්ගෙන් ලැබිය යුතු කුලී ආදායම අයකර ගැනීම සඳහා දැනටමත් නීතිමය පියවර ගෙන ඇති බව මේ සම්බන්ධයෙන් සභාපතිවරයා ඔහුගේ පිළිතුරෙහි සඳහන් කර තිබුණි."

**(ඇ) ගෙවිය යුතු තැන්පතු හා රඳවා ගැනීම්**

(i) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු තැන්පතු හා රඳවා ගැනීම් එකතුව රු.6,834,606,448 ක් වූ අතර මෙම ශේෂ ගෙවිය යුතු ප්‍රමාද ගාස්තු, ආපසු ගෙවිය යුතු තැන්පතු, කාර්යසාධන ඇපකර තැන්පතු, ආරක්ෂක තැන්පතු හා ගෙවිය යුතු කුලී තැන්පතු ආදියෙන් සමන්විත විය. කෙසේ වුවද ඉතා දිගු කාලයක් මෙම තැන්පතු නිරවුල් කිරීම සඳහා අධිකාරිය විසින් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්තු 567 කට අදාළව රු.493,529,142 ක් වූ රඳවා ගැනීම් මුදල් වර්ෂ 3 සිට වර්ෂ 8 දක්වා කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණු බව නිරීක්ෂණය විය.

(iii) පොදු තැන්පතුවල ඇතුළත් රු.20,202,123 ක් වූ පහත සඳහන් තැන්පතු 2013 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකර පැවතුණු අතර තවදුරටත් ප්‍රමාදයකින් තොරව එම තැන්පතු නිරවුල් කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

| | විස්තරය | කාල පරිච්ඡේදය | මුදල |
|---|---|---|---|
| | | | රු. |
| I | සේවා තැන්පතු | 2001,2006,2011,2012 | 5,886,430 |
| II | කුලී තැන්පතු | 2008,2009,2010 | 13,935,693 |
| III | තැන්පතු - වෙනත් ප්‍රාදේශීය | 2010 | 300,000 |
| IV | කොන්ත්‍රාත්කරුවන් 8 දෙනෙකුගේ තැන්පතු (මාර්ග නඩත්තු කිරීම හා ඉදිකිරීම) | 1986 | 80,000 |
| | එකතුව | | 20,202,123 |

**(ඈ) ගෙවිය යුතු වෙළඳ ශේෂ**

ද්‍රව්‍ය මිලදී ගැනීම හා ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවන්ට අවස්ථා 43 කදී ගෙවිය යුතු වූ වෙළඳ ණයගැතියන් තුළ ඇතුළත් රු.356,139,840 ක මුදලක් වර්ෂ 1 කට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි. ගිණුම් 05 ක එම ශේෂවලින් රු.5,441,051 ක්වූ ශේෂ වර්ෂ 05 කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂ විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ඍජු සනාථ කිරීම්, උපලේඛන හා ප්‍රසම්පාදන පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන ආදී සාක්ෂි නොමැති වීම හේතුවෙන් එකතුව රු.17,530,089,407 ක් වූ බැංකු ශේෂ, මාර්ගස්ථ මුදල්, බැංකු ණය හා වෙළඳ දැන්වීම් වියදම් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කළ නොහැකි විය.

**2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනත 8 (1) වගන්තිය | | 2013 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අයවැය ලේඛනය 2012 සැප්තැම්බර් 30 දිනට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත්, එය 2012 නොවැම්බර් 12 දින අනුමත කර තිබූ අතර සංශෝධිත අයවැය ලේඛනය 2013 දෙසැම්බර් 06 දින අනුමත කර තිබුණි. |
| (ආ) | මුදල් රෙගුලාසි | | |
| | (i) | මුදල් රෙගුලාසි 396 | බැංකු ගිණුම් හයකට අදාළව රු.28,670 ක් වූ කල් ඉකුත් වූ චෙක්පත් 12 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 373 හා 2013 සැප්තැම්බර් 30 දිනැති අංක 332 දරන කාර්යාල චක්‍රලේඛය | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අධිකාරියේ උප කාර්යාල 03 කට ලබා දෙන ලද එකතුව රු.48,845 ක් හා රු.438,980 ක් වූ පිළිවෙලින් සුළු මුදල් අග්‍රිම හා ඉන්ධන අග්‍රිම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නිරවුල් කර නොතිබුණි. |
| (ඇ) | 2007 දෙසැම්බර් 18 දිනැති අංක පීඊඞී/47 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | 2013 – 2017 වර්ෂ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ සංයුක්ත සැලැස්ම මුදල් වර්ෂය ආරම්භ වීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, මාර්ග සංවර්ධන අධිකාරිය විසින් එම සැලැස්ම නියමිත දින ඉදිරිපත් කර නොතිබුණි. එම සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 අප්‍රේල් 23 දින අනුමත කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 547.17 ක බදු පූර්ව ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා රු.මිලියන 547.43 ක බදු පූර්ව ශුද්ධ ඌනතාවයක් වූ හෙයින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල රු.මිලියන 1,094.6 ක වැඩිවීමක් දැක්වුණි.

රු.මිලියන 6,181 කින් වැය අරමුදල් අතිරික්තය හා වෙනත් ආදායම් වැඩිවීම සහ සංවර්ධනය හා නඩත්තු වියදම්, පුද්ගලික පඩිනඩි, ක්ෂය සහ ක්‍රමක්ෂය පිළිවෙලින් රු.මිලියන 2,647 කින්, රු.මිලියන 1,909 කින් හා රු.මිලියන 545 කින් අඩුවීම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල වැඩිවීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතූන් විය.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන සැලකිය යුතු ශේෂයන් කිහිපයක් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | 2013 | 2012 |
| | රු.මිලියන | රු.මිලියන |
| ශුද්ධ ජංගම වත්කම් | (1,681) | (3,170) |
| ශුද්ධ වත්කම් | 124,552 | 69,355 |
| සමුච්චිත ඌනතාවය | (8,012) | (8,205) |

2013 වර්ෂය තුළ රු.මිලියන 54,655 කින් අධිවේගී මාර්ගවල පිරිවැය ප්‍රාග්ධනිත කිරීම අධිකාරියේ ශුද්ධ වත්කම් වැඩිවීමට හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 අධිකාරියේ නඩත්තු වැඩ - ජාතික මාර්ග හා පාලම්

සමාලෝචිත වර්ෂය සඳහා ජාතික මාර්ග හා පාලම් නඩත්තු කිරීම සම්බන්ධයෙන් අරමුදල් වෙන් කිරීම හා තථ්‍ය වියදම් පහත පරිදි වේ.

| | මුල් වෙන්කිරීම | සංශෝධිත වෙන්කිරීම | තථ්‍ය වියදම | උපයෝජනය මුල් වෙන්කිරීමේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| සාමාන්‍ය නඩත්තු කිරීම | 1,835 | 2,360.4 | 2,476.4 | 134 |
| අඛණ්ඩ නඩත්තු කිරීම | 1,000 | 1,593.0 | 1,691.9 | 169 |
| කාලීන නඩත්තු කිරීම | 1,905 | 949.1 | 1,046.4 | 55 |
| ජලාපවහන පද්ධති නඩත්තු කිරීම | 760 | 221.9 | 284.6 | 37 |
| සංඥා ලාම්පු නඩත්තු කිරීම | 780 | 459.0 | 490.8 | 63 |
| හදිසි හා ස්වභාවික ආපදා යටතේ නඩත්තු වැඩ | 600 | 1,909.1 | 1,152.6 | 192 |
| තොටුපොළ මෙහෙයුම් හා නඩත්තු කිරීම | 20 | 7.1 | 7.2 | 36 |
| එකතුව | 6,900 | 7,499.6 | 7,149.9 | |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග නඩත්තු කිරීම**

2013 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු හා ක්‍රියාකාරී සැලැස්ම අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය සතු A හා B වර්ගයේ මාර්ග නඩත්තු කිරීම සඳහා රු.මිලියන 7,500 ක මුදලක් වෙන්කර තිබුණි. නඩත්තු, කළමනාකරණ හා ඉදිකිරීම් අංශයේ අධ්‍යක්ෂගෙන් ලබාගත් තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ මෙම කාර්ය සඳහා රු.මිලියන 493.86 ක මුදලක් වැය කර තිබුණු අතර 2013 වර්ෂය සඳහා පළාත් මාර්ග නඩත්තුව සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණද මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන පළාත් 09 ක පළාත් මාර්ග 212 ක් සඳහා රු.මිලියන 990.17 ක මුදලක් වැයකර තිබුණි. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන වෙනත් මාර්ග සඳහා ප්‍රතිපාදන උපයෝජනය කිරීම හේතුවෙන් A හා B වර්ගයේ මාර්ග නඩත්තුව පිළිබඳ අපේක්ෂිත කාර්ය සාධනය ඉටුකර ගත නොහැකි විය.
" මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග ව්‍යාපෘති විවෘත කිරීම් උත්සව වැනි ජාතික අවශ්‍යතාවයන් සැලකීමෙන් වැඩවල හදිසි අවශ්‍යතාවය හේතුවෙන් එම කාර්යයන්ට යොමු වීමට සිදු වූ අතර මාර්ග සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති සඳහා ද්‍රව්‍ය ප්‍රවාහනය හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග හානිවීම නිසා යාබද මාර්ග වැඩිදියුණු කිරීමටද සිදු වූ බව " සභාපති ඔහුගේ පිළිතුරෙහි සඳහන් කර තිබුණි.

**(ආ) මාර්ග නඩත්තු කිරීම පිළිබඳ කාර්යසාධනය**

2013 වර්ෂය සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, මාර්ග නඩත්තු වැඩ සඳහා රු.මිලියන 6,701 ක මුදලක් වෙන්කර තිබුණි. වර්ෂය තුළ එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පළාත් 09 ක් විසින් දරන ලද වියදම, රු.565,114,985 කින් ප්‍රතිපාදන ඉක්මවා තිබුණු අතර එක් පළාතක ප්‍රතිපාදනයට වඩා රු.23,854 කින් අඩුවෙන් වැය කර තිබුණි.

(ii) මාර්ග නඩත්තු වැඩ සඳහා කරන ලද වෙන් කිරීමෙන්, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ගවල නඩත්තු වැඩ සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.493,861,485 ක මුදලක් වැයකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ මාර්ග නඩත්තුව සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඉක්මවා තිබුණි. ජාතික අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් වැඩවල හදිසි අවශ්‍යතාවය මත මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග වැඩ සඳහා යෙදුණු බව මේ සම්බන්ධයෙන් සභාපතිවරයාගේ පිළිතුරෙහි දක්වා තිබුණි

**(ඇ) කාලීන නඩත්තු කිරීම් වැඩ, කාණු පද්ධති නඩත්තු කිරීම, සංඥා ලාම්පු නඩත්තු කිරීම හා හදිසි හා ස්වාභාවික ආපදා යටතේ නඩත්තු වැඩ**

කාලීන නඩත්තු කිරීම් වැඩ, කාණු පද්ධතිවල නඩත්තු කිරීම් වැඩ, සංඥා ලාම්පු සහ හදිසි හා ස්වාභාවික ආපදා යටතේ නඩත්තු වැඩ සඳහා 2013 වර්ෂය සඳහා වාර්ෂික අයවැය මඟින් රු.මිලියන 3,539.3 ක මුදලක් වෙන්කර තිබුණි.
නඩත්තු, කළමනාකරණ හා ඉදිකිරීම් අංශය විසින් පිළියෙල කරන ලද වාර්ෂික නඩත්තු කිරීම් වැඩසටහනට අනුව, ඉහත නඩත්තු වැඩ පිළිබඳ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පළාත් කාර්යාල 09 කට අදාළව රු.මිලියන 2408.62 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව මුළු නඩත්තු වැඩ 668 ක් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| නඩත්තු වැඩ | සංශෝධිත වෙන්කිරීම | වර්ෂය තුළ ක්‍රියාත්මක නොකරන ලද නඩත්තු වැඩ | | |
|---|---|---|---|---|
| | | පළාත් කාර්යාල සංඛ්‍යාව | වැඩ සංඛ්‍යාව | ඇස්තමේන්තුගත පිරිවැය |
| | රු.මිලියන | | | රු.මිලියන |
| කාලීන වැඩ | 949.16 | 9 | 238 | 1,214.72 |
| කාණු පද්ධති | 221.91 | 9 | 285 | 666.4 |
| සංඥා ලාම්පු නඩත්තුව | 459.08 | 4 | 32 | 67.6 |
| හදිසි හා ස්වභාවික ආපදා යටතේ වැඩ | 1,909.15 | 6 | 113 | 459.9 |
| එකතුව | 3,539.3 | 9 | 668 | 2,408.62 |

(ii) පළාත් කාර්යාල 9 කට අදාළව නඩත්තු වැඩ සංඛ්‍යාව 182 ක් සඳහා එකතුව රු.මිලියන 456.36 ක් වැය කර තිබුණද, නඩත්තු, කළමනාකරණ හා ඉදිකිරීම් අංශය විසින් පිළියෙල කරන ලද වාර්ෂික නඩත්තු වැඩසටහනේ මෙම නඩත්තු වැඩ ඇතුළත් කර නොතිබුණි.

(iii) නඩත්තු වැඩ සඳහා අයවැයගත ප්‍රතිපාදනය රු.මිලියන 3,539.3 ක් වුවද ඒ සඳහා දරන ලද තථ්‍ය වියදම රු.මිලියන 4,487.52 ක් විය. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ නඩත්තු වැඩ සඳහා කරන ලද ප්‍රතිපාදනය රු.මිලියන 948.22 කින් ඉක්මවා තිබුණි.
කාලීන නඩත්තු වැඩසටහනේ සමහර මාර්ග දේශීය හා විදේශීය මූල්‍යායන පුනරුත්ථාපන ව්‍යාපෘති සඳහා තෝරා ගෙන තිබූ බවත්, එබැවින් සමහර විෂයයන් මුල් වැඩසටහනෙන් ඉවත් කළ බවත් මේ සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

## 4.2 කොන්ත්‍රාත් පරිපාලනය

### 4.2.1 මාර්ග පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම්**

රජයේ අරමුදල් යටතේ මාර්ග නඩත්තු හා වැඩිදියුණු කිරීම් වැඩ සඳහා වෙන්කිරීම්, කාර්ය සාධන වාර්තා, ක්‍රියාකාරී සැලැස්ම හා පළාත් අධ්‍යක්ෂවරුන් විසින් එවන ලද ප්‍රගති වාර්තා අනුව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) ගිණුම් වර්ෂයේදී රු.මිලියන 2,577 ක් වටිනා මාර්ග 22 ක් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම ආරම්භ කිරීමට ඉලක්ක කර තිබුණද, කිසිදු ඉදිකිරීමක් හෝ වැඩිදියුණු කිරීමක් ආරම්භ කර නොතිබුණි.

(ii) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ග 183 ක් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා 2013 වර්ෂය තුළදී රු.මිලියන 5,049.06 ක මුදලක් වැයකර තිබුණි.

(iii) ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 13,395 ක් වෙන්කරන ලද මාර්ග 103 ක පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම 2013 දෙසැම්බර් 31 දිනට සියයට 50 කට අඩු මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.

(iv) 2013 දෙසැම්බර් 31 දිනට නිමකර තිබූ මාර්ග 25 ක පුළුල් කිරීම් හා වැඩිදියුණු කිරීම් සඳහා රු.මිලියන 538 ක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා නොතිබුණි.

(v) කාර්යාල 06 ක පළාත් අධ්‍යක්ෂවරුන් විසින් 2013 වර්ෂය සඳහා මාර්ග පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් තොරතුරු එවා නොතිබුණි. ඒ අනුව එම කාර්යාලවලට අදාළ කාර්යසාධනය පරීක්ෂා කළ නොහැකි විය.

"ජාතික මාර්ගවලට සම්බන්ධවන මාර්ග වැඩිදියුණු කිරීම සහ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් නොවන මාර්ගවල අබලන් තත්ත්වය හේතුවෙන් එම මාර්ග වැඩ සිදුකිරීම ඉතා අවශ්‍ය වූ බවත්, පොදු ප්‍රවාහන පහසුකරලීම සඳහා හා මහජනයාගේ ප්‍රවාහන ගැටලු විසඳීමට එම මාර්ග වැඩ සිදුකළ බවත් "මේ සම්බන්ධයෙන් සභාපතිවරයා විසින් දන්වා තිබුණි.

**(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ මාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් සිදුකිරීම**

---

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2012 හා 2013 වර්ෂවලදී පිළිවෙලින් මාර්ග පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට ලබාදෙන ලද රු. මිලියන 1,020 ක් හා රු.මිලියන 856.3 ක් වූ ප්‍රතිපාදන යටතේ කරන ලද වියදම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මූල්‍ය ප්‍රකාශන අනුව, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් 2012 හා 2013 වර්ෂවලදී ලැබුණු ප්‍රතිපාදන ඉක්මවායමින් මාර්ග ඉදිකිරීම් වැඩ සඳහා පිළිවෙලින් රු.මිලියන 1,858.5 ක් හා රු.මිලියන 261 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වැය කර තිබුණි. ඒ අනුව, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග පුළුල් කිරීම, වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සඳහා වෙන්කරන ලද අරමුදල් වෙනත් අමාත්‍යාංශවල අරමුණු සඳහා උපයෝජනය කර තිබූ බැවින් අධිකාරිය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කරන ලද කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද මාර්ග ඉදිකිරීම් විස්තර හා පිරිවැය මාර්ග සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

(iii) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙනුවෙන් සිදුකරන ලද මාර්ග ඉදිකිරීමේ වැඩ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ පොදුකාර්ය පිරිවැය ආවරණය කරගැනීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

**(ඇ) දේශීය බැංකු මඟින් මූල්‍යායනය කරන ලද මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතිය (LBFP)**

---

දිවයින පුරා කිලෝමීටර් 1,020.86 ක් දිග ප්‍රමුඛතා මාර්ග 62 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා දේශීය බැංකුවලින් එජඩො මිලියන 500 කට සමාන ණය මුදල් ලබා ගැනීමට මාර්ග සංවර්ධන අධිකාරියට අවසර ලබා දී තිබුණි. ඒ අනුව මාර්ග 50 ක් පුනරුත්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් 21 දෙනෙකුට රු.මිලියන 131,585 ක් වටිනා කොන්ත්‍රාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබා දී තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන අනුව ඉහත ව්‍යාපෘතිය (LBFP) යටතේ මාර්ග ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගෙන නොතිබුණි. ඒ වෙනුවට කොන්ත්‍රාත්කරුවන් විසින්ම අදාළ මාර්ග සඳහා කොන්ත්‍රාත් යෝජනා ඉදිරිපත් කර තිබුණි.

(ii) කොන්ත්‍රාත්කරුවන්ගේ යෝජනා තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC) විසින් විධිමත්ව ඇගයීම් කර නොතිබුණි. තවද වැඩ විෂයයන්, ප්‍රමාණයන් හා ඇගයීම් තහවුරු කර ගැනීම සඳහා රේටයන් ඇතුළත්ව එක් එක් මාර්ගය සඳහා ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. එබැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මහාමාර්ග සම්මත රේටයන් (Highway Standards Rate) යොදාගනිමින් කොන්ත්‍රාත්කරුගේ යෝජනා ඇගයීම් කර තිබුණි. කෙසේ වුවද ප්‍රමාණ පත්‍රවල ( BOQ) කොන්ත්‍රාත්කරුවන් විසින් යෝජනා කරන ලද රේටයන් ඉංජිනේරු රේටයන්ට සාපේක්ෂව ඉතා ඉහළ අගයක් ගෙන තිබූ අතර එක් කොන්ත්‍රාත්කරුවකුගෙන් තවත් කොන්ත්‍රාත්කරුවකුට රේටයන් වෙනස් වී තිබුණි.

(iii) අමාත්‍ය මණ්ඩලය පත්කරන ලද සම්මත ප්‍රසම්පාදන කමිටුව (SCAPC) විසින් එක් එක් කොන්ත්‍රාත්තුව සඳහා අවසන් කොන්ත්‍රාත් මුදල තීරණය කර නිර්දේශ කර තිබුණි. ඒ අනුව, කොන්ත්‍රාත් 54 ක් සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද රු.මිලියන 146,552.78 ක මුදල අමාත්‍ය මණ්ඩල සම්මත ප්‍රසම්පාදන කමිටුව (SCAPC) විසින් රු.මිලියන 155,794.94 දක්වා වැඩි කර තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් මාර්ග ඉදිකිරීම සඳහා රු.මිලියන 9,242.16 ක අතිරේක පිරිවැයක් නිර්දේශ කර තිබුණි.

(iv) අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව, දේශීය බැංකු මූල්‍යායන ව්‍යාපෘතිය (LBFP) යටතේ සියළු ඉදිකිරීම් , දේශිය කොන්ත්‍රාත්කරුවන්ගේ ධාරිතාවය වැඩිකිරීම සඳහා දේශිය කොන්ත්‍රාත්කරුවන් මඟින් සිදුකළ යුතුය. කෙසේ වුවද වැඩි කොන්ත්‍රාත් ප්‍රමාණයක් දේශිය කොන්ත්‍රාත්කරුවන් කිහිපදෙනෙකුට පමණක් ලබා දී තිබූ හෙයින් මෙම අරමුණ සතුටුදායකව ඉටුකර ගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණි.

(v) 2012 වර්ෂයේ මුල් භාගයේදී මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඇස්පල්ට් අතුරන ලද මාර්ග වල සමහර කොටස් දේශීය බැංකු මූල්‍යායන ව්‍යාපෘතිය යටතේ පුනරුත්ථාපනය කිරීම සඳහා නැවතත් ඇතුළත් කර තිබූ බව විගණන නියැදි පරීක්ෂණයේදී අනාවරණය විය.

### 4.2.2 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වානේ පාලම් ඉදිකිරීම

---------------------------------------------------

එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වානේ පාලම් 10 ක් රු.3,831,936,290 ක මුදලක් වැය කරමින් ඉදිකර තිබුණි. ඉන් රු.336,328,087 ක මුදලක් ලංකා පටුන පාලම හා පාල තෝප්පූර් - සේරුවිල පාලම ඉදිකිරීම සඳහා හා රු.3,495,608,203 ක මුදලක් නගරයට ඇතින් සම්බන්ධවන මඩකලපුව - තිරුක්කොන්ඩයි ආරු - ත්‍රිකුණාමලය (A – 15) මාර්ගයේ හා අඹේපුස්ස - කුරුණෑගල - ත්‍රිකුණාමලය (A- 6) මාර්ගයේ පාලම් 08 ක් ඉදිකිරීම සඳහා වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(i) 2009 හා 2010 වර්ෂවලදී රු.මිලියන 3,495.6 ක මුදලක් වැය කරමින් ත්‍රිකුණාමලයේ පිටත වටරවුම් මාර්ගයේ පාලම් 8 ක් ඉදිකර තිබුණි. එසේ වුවද මෙම පාලම් සම්බන්ධවන මාර්ග ඉදිකිරීම් වර්ෂ 4 ක් ඉකුත් වී තිබුණද වාහන ගමනාගමනය සඳහා හැකිවන පරිදි නිමකර නොතිබුණි.

(ii) පාල තෝප්පූර් - සේරුවිල පාලම ප්‍රධාන මාර්ගයට සෘජුවම සම්බන්ධවන ලෙස ඉදිකර තිබූ හෙයින් දිගු වාහන ඇතුල්වීම හා පිටවීම සඳහා යොදාගැනීමේදී ප්‍රධාන මාර්ගය සම්පූර්ණයෙන්ම භාවිතා කිරීමට සිදු වී තිබුණි. විධිමත් සැලැස්මකට පාලම ඉදි නොකිරීම හේතුවෙන් මෙම ගැටලුව පැන නැඟී තිබුණි.

## 4.3 නිශ්ඵල ගනුදෙනු

**පොදුකාර්ය වියදම් පාලනය හා පොදුකාර්ය වියදම් ප්‍රතිපූර්ණය කිරීම**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකක 03 ක් සඳහා පොදුකාර්ය වියදම් වශයෙන් වර්ෂ 3 කට වැඩි කාලයක් වැය කරන ලද රු. 3,590,402 ක මුදලක් අයකර ගැනීමට 2013 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ii) වර්ෂ 01 කට වැඩි කාලයක් වූ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකක 02 ක් සඳහා ගෙවන ලද රු.4,633,609 ක්වූ වැටුප් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(iii) ව්‍යාපෘති වාහන සඳහා ලැබුණු රු.1,708,495 ක් වූ රක්ෂණ හිමිකම් බැර ශේෂය පොදු කාර්ය පාලන හා පොදුකාර්ය වියදම් ප්‍රතිපූර්ණ ගිණුමේ ඇතුළත් කර තිබුණි. මෙම ගිණුම් නිරවුල් කර ගැනීමට 2013 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4.4 වත්කම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ගර්හිත හෝ ඌන උපයෝජිත යන්ත්‍රෝපකරණ**

(i) මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු කාර්යාල 14 ක 2013 දෙසැම්බර් 31 දිනට ගර්හිත හෝ ඌන උපයෝජිත යන්ත්‍රෝපකරණ 39 ක් පැවතුණු අතර එම වත්කම්වල වටිනාකම රු. 5,250,621 ක් විය. තවද, වටිනාකම විගණනයට ඉදිරිපත් නොකරන ලද යන්ත්‍ර හා උපකරණ 55 ක් පළාත් කාර්යාල 18 ක ඌන උපයෝජිතව පැවතුණි. එම වත්කම් අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) 2011 වර්ෂයේදී ජනාධිපති කාර්යසාධන බලකාය විසින් ලබාදෙන ලද යන්ත්‍රවලින් රු.349,193,473 ක් වටිනා " චිප් ස්ප්‍රෙඩර් " යන්ත්‍ර 11 ක් ස්ප්‍රෙඩර් යන්ත්‍ර ලබාගත් අවස්ථාවේ සිටම නිෂ්කාර්යව පැවතුණු අතර එම යන්ත්‍ර දේශීය මාර්ග සඳහා උපයෝජනය කළ නොහැකි බවද නිරීක්ෂණය විය.

(ආ) **මෝටර් වාහන**

**---------------------**

මාර්ග සංවර්ධන අධිකාරියට අයත් රු.86,330,062 ක් වටිනා මෝටර් වාහන 44 ක් වෙනත් ආයතනවලට මුදා හැර තිබුණි. මෙම මෝටර් වාහන 2013 දෙසැම්බර් 31 දිනට බාහිර ආයතන විසින් රඳවා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එම මෝටර් වාහන මාර්ග සංවර්ධන අධිකාරියට ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **නීත්‍යානුකූලව පවරා නොගත් ඉඩම්**

**----------------------------------------**

2009 ජුනි 15 දිනැති අමාත්‍ය මණ්ඩලයේ තීරණය අනුව, රු.25,604,180 ක් වටිනා පෑලියගොඩ පිහිටි හෙක්ටයාර් 1.5907 ක ප්‍රමාණයක ඉඩම 1990 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් මාර්ග සංවර්ධන අධිකාරියට ලබා දීමට තිබුණි. ඉඩමේ අයිතිය මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දීම සඳහා 2014 අගෝස්තු 07 වන විටත් කටයුතු කර නොතිබූ බවත් 2009 වර්ෂයේදී මෙම ඉඩම මහ නැඟුම මාර්ග ඉදිකිරීම් හා උපකරණ සමාගමට එහි ප්‍රධාන කාර්යාලය පවත්වා ගැනීම සඳහා ලබා දී තිබූ බවත් නිරීක්ෂණය විය. කෙසේ වුවද අධිකාරිය විසින් මෙම ඉඩමෙන් කිසිදු ආදායමක් මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

(ඇ) **උපයෝජනය නොකළ හා සෙමින් චලනය වන තොග**

**-------------------------------------------------------**

රු.2,708,554 ක්වූ උපයෝජනය නොකළ හා සෙමින් චලනය වන තොග වර්ෂ 1 කට වැඩි කාලයක් පැවතුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **සේවක සංඛ්‍යාව**

**---------------------**

(i) සේවක සංඛ්‍යාව පිළිබඳ සැසඳීමේදී තනතුරු 05 ක පුරප්පාඩු සංඛ්‍යාව 380 ක් හා වෙනත් තනතුරු 05 ක අතිරික්ත සංඛ්‍යාව 127 ක් බව අනාවරණය විය.

(ii) මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යයන් සිදු කිරීම සඳහා අත්‍යවශ්‍ය වූ තාක්ෂණ සේවා තනතුරු 45 ක හා කළමනාකරණ සහකාර හා තාක්ෂණ සේවා තනතුරු 57 ක පුරප්පාඩු නිරීක්ෂණය විය. මෙම තත්ත්වය මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්ය සාධනය සඳහා අහිතකර ලෙස බලපාන බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා ආයතන සඳහා මුදා හරින ලද මානව සම්පත්**

**-------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2013 දෙසැම්බර් 31 දිනට මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් 131 ක් මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශයට හා ජනාධිපති ලේකම් කාර්යාලයට මුදාහැර තිබුණි. අධිකාරිය විසින් එම නිලධාරීන් සඳහා ගෙවන ලද රු.70,412,563 ක් වූ වැටුප් හා අත්තිකාරම් එම ආයතනවලින් අයකර ගෙන නොතිබුණි.

(ii) මාර්ග සංවර්ධන අධිකාරියේ කාර්යයන් සඳහා සම්බන්ධයක් නොමැති රජයේ ආයතන 6 කට මුදා හරින ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයන් 07 දෙනෙකු සඳහා ගෙවන ලද රු.4,575,841 ක්වූ මුදලින් රු.934,657 ක්වූ වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය කර ගැනීමට 2013 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.6 ප්‍රසම්පාදන අංශයේ කාර්යසාධනය**

----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදනයන් විධිමත් හා කාර්යක්ෂම ආකාරයෙන් සිදුකිරීමේ අරමුණ සහිතව ප්‍රසම්පාදන අංශය ස්ථාපිත කර තිබුණි. එහෙත් ප්‍රසම්පාදන අංශයේ කාර්යයන් පසුගිය වර්ෂ කිහිපයේදී ක්‍රමයෙන් අඩු වී තිබුණි.

(ii) එම අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 37 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 14 ක් විය. එම අංශයේ සිටි නිලධාරීන් වූයේ අධ්‍යක්ෂ හා සැපයුම් නිලධාරි පමණක් විය.

(iii) රු.මිලියන 23.8 ක්වූ ලිපිද්‍රව්‍ය ප්‍රසම්පාදනය පමණක් ප්‍රසම්පාදන අංශය විසින් සිදුකර තිබූ අතර අනිකුත් ප්‍රසම්පාදන වෙනත් අංශ විසින් සිදුකර තිබුණි.

**5 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

------------------------------------------

**5.1 අයවැය පාලනය**

--------------------

2013 වර්ෂය සඳහා අයවැය ලේඛනය වර්ෂය අවසානයේ සංශෝධනය කර තිබූ අතර සංශෝධිත අයවැය 2013 දෙසැම්බර් 06 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබුණි. එබැවින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**6 පද්ධති හා පාලන**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) මාර්ග නඩත්තු කිරීම් හා සේවාදායක වැඩ
(ආ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
(ඇ) සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු හෙළිදරව් කිරීම
(ඈ) ප්‍රාදේශීය කාර්යාල කළමනාකරණය
(ඉ) භෞතික හා මානව සම්පත් උපයෝජනය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය
(උ) ඉන්වෙන්ට්‍රි පාලනය